# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව



+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.08.31 |


## ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ජූලි 2023

**ඉදිකිරීම් කටයුතුවල පවතින දුර්වල ක්‍රියාකාරීත්වය තුළ 2023 ජූලි මාසය තුළදී ඉදිකිරීම් කටයුතු සඳහා වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය 43.2ක අගයක් වාර්තා කරන ලදී.** මෙහිදී, පවතින අභියෝගාත්මක වාතාවරණය හමුවේ බොහෝ සමාගම් සිය ව්‍යාපාරික පැවැත්ම ආරක්ෂා කරගැනීම සඳහා උත්සාහ ගනිමින් සිටින බව සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. කෙසේ වුවද, ක්‍රමයෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල පහත වැටීම, සීමිත මට්ටමින් වුවද ක්‍රියාත්මකවන ඉදිකිරීම් සඳහා රුකුලක් වී ඇත. තවද, තාවකාලික වශයෙන් අත්හිටුවා තිබූ රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක් ද ජූලි මාසය තුළදී සුළු වශයෙන් වුවද නැවත ආරම්භ කර ඇත.

පසුගිය මාසයට සාපේක්ෂව අඩු මට්ටමෙන් වුවද නව ඇණවුම් ජූලි මාසය තුළදී ද පහත වැටුණි. මෙහිදී, ටෙන්ඩර් අවස්ථා බොහෝදුරට විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති කිහිපයකට සීමා වී ඇති අතර, පෞද්ගලික සේවාදායකයින් ද ඉදිකිරීම් වියදම් තවදුරටත් පහළ යන තෙක් ආයෝජන පමා කරන බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. එසේම, දැනට ව්‍යාපෘතිවල නිරතව සිටින සමාගම් සතු අතිරික්ත ධාරිතාවය හේතුවෙන් අනෙකුත් සමාගම්වලට උපකොන්ත්‍රාත් ලබාදීම ද සීමා වී ඇත. මේ අතරතුර, සමාගම් විසින් තමාට අත්‍යවශ්‍ය සේවකයින් පමණක් රඳවා ගැනීමට කටයුතු කරන බැවින් සේවා නියුක්තිය ද ජූලි මාසය තුළදී පහත වැටුණි. තවද, බොහෝ සමාගම් ආයෝජන පමා කරන වාතාවරණය තුළ කෙටිකාලීන අවශ්‍යතා සඳහා පමණක් සීමිතව මිලදී ගැනීම් සිදු කිරීම හේතුවෙන් තොග මිලදී ගැනුම් ද ජූලි මාසය තුළදී පහත වැටුණි. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ස්ථාවර මට්ටමක පැවතුනු අතර සමහර සැපයුම්කරුවන් ණයට භාණ්ඩ සැපයීමට ද නැඹුරුවක් දක්වන බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී

| විචල්‍යය | ජුනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **සමස්ත ක්‍රියාකාරකම්** | **44.4** | **43.2** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| නව ඇණවුම් | 38.9 | 45.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 30.6 | 29.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 41.7 | 39.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 47.2 | 50.0 | + | නොවෙනස්ව පවතී |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කිරීම, පොලී අනුපාතික සහ අමුද්‍රව්‍ය සඳහා වියදම් පහත වැටීම සහ දැනට අත්හිටුවා ඇති රජයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා පවතින සාකච්ඡා හේතුවෙන් සමාගම්වල ඉදිරි මාස තුන පිළිබඳ ව්‍යාපාර අපේක්ෂා යහපත් මට්ටමක පැවතුණි.

**සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**

**2023 ජූලි**

**43.2**

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




### ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[1]

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගය පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

### විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

සමස්ත ක්‍රියාකාරකම් : ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සමස්ත පරිමාව. මෙය ජාත්‍යන්තර ක්‍රමවේදය අනුගමනය කරමින් “ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය" ලෙස හඳුන්වන මූලික දර්ශකය වන අතර එය කර්මාන්ත අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය හා සැසඳිය හැකි වේ..

සේවා නියුක්තිය: සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන.

තොග මිලදී ගැනුම්: නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන ගබඩා කර තැබීම.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය: සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය.

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.

### සමීක්ෂණ ප්‍රතිචාර

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ශව අදාල මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

[1]ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කර ඇත්තේ ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදකයා ලෙස හඳුනාගෙන ඇති ලොව පුරා ආර්ථිකයන් 40කට අධික සංඛ්‍යාවක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදනය කරනු ලබන එස්&පී ග්ලෝබල් (S&P Global) අනුගමනය කරනු ලබන ක්‍රමවේදය භාවිතයෙනි.